WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,432 — 1958 ජූලි 19 වැනි සෙනසුරාද — 19.7.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**ඇම්.ටී. 8/58 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

### 1950 අංක 29 දරණ මිල පාලන පණත

**නියෝගය**

මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිල පාලක තැන්පත් චාර්ල්ස් සැම්සන් රනසූරිය වන මම 1950 අංක 29 දරන මිල පාලන පනතේ 4 වැනි සහ 3 (2) යන කොටස් වලින් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූනි 11 වෙනි දින අංක 11,354 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද, 1958 ජූනි 6 වෙනි දින ඇම්.ටී. 5/1958 දරණ ආහාර මිල නියෝගයේ 7, 8, 9 සහ 11 වෙනි තීරයන්හි උලුඳු (පියලි නොකළ) ,කඩල පරිප්පු, මසූර් පරිප්පු සහ අර්තාපල් පිළිබඳව එම උප ලේඛනවල සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි ;

(2) මීට යාකර ඇති උප ලේඛනවල 2 සිට 5 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දල බර හොණ්ඩර යක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, එම උප ලේඛන වල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල විකිණිය හැකි වැඩිම මිල මේ දැන් පටන් එම උප ලේඛනවල 2 සිට 5 වැනි තීරවල සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි ;

(3) මෙම උප ලේඛනවල 2 සිට 5වැනි තීරයන්හි සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958 ජූනි 11වැනි දින අංක 11,354 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 ජූනි 6වැනි දින ඇම්.ටී. 5/1958 දරණ ආහාර මිල නියෝගයේ (iii) සිට (viii) දක්වා ඡේදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතු ලෙස ද මෙම නියෝගයෙන් නියම ක්‍රමි.

1958 ජූලි මස 15 වැනි දින ප. ව. 2.45 මාතර කච්චේරියේදී අත්සන් කරන ලදී.

සී. ඇස්. රනසූරිය,
මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිල පාලක තැන.

### උප ලේඛනය

**දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ**

| 1 වැනි තීරය | 2වැනි තීරය | 3වැනි තීරය | 4වැනි තීරය | 5වැනි තීරය |
|---|---|---|---|---|
| ප්‍රදේශය | උලුඳු (පියලි නොකළ) රු. ශ. | කඩල පරිප්පු රු. ශ. | මසූර් පරිප්පු රු. ශ. | අර්තාපල් රු. ශ. |
| මාතර නගර සහා සීමාව, දෙව්නුවර සුලු නගර සභා සීමාව, දෙව්නුවර ගම් කායර්‍ය සභා සීමාව, කැකනදූර ගම් කායර්‍ය සභා සීමාව, මඩිහ–ගොඩගම ගම් කායර්‍ය සභා සීමාව, මාලිම්බඩ ගම් කායර්‍ය සභා සීමාව, මොලොද්දූව ගම් කායර්‍ය සභා සීමාව,නායිමන මාකාවිට ගම් කායර්‍ය සභා සීමාව | 48 76 | 42 29 | 56 08 | 31 0 |
| වැලිගම නගර සභා සීමාව, වැලිගම ගම් කායර්‍ය සභා සීමාව | 48 66 | 42 19 | 55 98 | 30 90 |
| අකුරැස්ස ගම්කායර්‍ය සභා සීමාව, ගොඩපිටිය ගම්කායර්‍ය සභා සීමාව | 49 01 | 42 54 | 56 33 | 31 25 |
| හක්මන ගම් කායර්‍ය සභා සීමාව, කඹුරුපිටිය ගම් කායර්‍ය සභා සීමාව, කන්දපිට, වලකඩ ගම් කායර්‍ය සභා සීමාව, දික්වැල්ල ගම් කායර්‍ය සභා සීමාව | 49 21 | 42 74 | 56 53 | 31 45 |
| මොරවක ගම් කායර්‍ය සභා සීමාව | 49 26 | 42 79 | 56 58 | 31 50 |
| බෙරලපනාතර ගම්කායර්‍ය සභා සීමාව, දෙනියාය ගම් කායර්‍ය සභා සීමාව | 49 51 | 43 04 | 56 83 | 31 75 |

**සැළකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල් ගණන්ය, මේ මිල ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකිය,

1935—ජේ. ඇන්. ආර් 25139—4,474 (7/58)

### උප ලේඛනය

**ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල**

| 1 වැනි තීරය | 2වැනි තීරය | 3වැනි තීරය | 4වැනි තීරය | 5වැනි තීරය |
|---|---|---|---|---|
| ප්‍රදේශය | උඳුලු (පියලි නොකළ) | කඩල පරිප්පු | මසූර් පරිප්පු | අර්තාපල් |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| මාතර නගර සභා සීමාව, දෙවිනුවර සුලු නගර සභා සීමාව, දෙවිනුවර ගම් කායඵ සභා සීමාව, කැකනාදුර ගම් කායඵ සභා සීමාව, මඩිහ ගොඩගම ගම් කායඵ සභා සීමාව, මාලිම්බඩ ගම් කායඵ සභා සීමාව, මොලොද්දුව ගම් කායඵ සභා සීමාව, නායිමන මාකාවිට ගම් කායඵ සභා සීමාව, වැලිගම නගර සභා සීමාව, වැලිගම ගම් කායඵ සභා— සීමාව, අකුරැස්ස ගම් කායඵ සභා සීමාව, ගොඩපිටිය ගම් කායඵ සභා සීමාව, හක්මන ගම්කායඵ සභා සීමාව, කඹුරුපිටිය ගම් කායඵ සභා සීමාව, කන්ද පිටවලකඩ ගම් කායඵ සභා සීමාව, දික්වැල්ල ගම් කායඵ සභා සීමාව, මොරවක ගම් කායඵ සභා සීමාව, බෙරලපනාතර ගම් කායඵ සභා සීමාව, දෙනියාය ගම් කායඵ සභා සීමාව | 0 49 ... | 0 45 ... | 0 56 ... | 0 33 |

**සැළකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිල ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**වී 48 දරණ ආහාර මිළ නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

## 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

වවුනියාවේ උප (ආහාර) මිල පාලක තැන්පත් සෙල්ලප්පා සින්නතම්බි වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පවරා තිබෙන බලතල අනුව මෙ නියෝගයෙන්—

(1) 1958 ජුනි මස 25 වන දින අංක 11,375 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1958 ජුනි මස 25 වෙනි දින අංක වී 47 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ (1) වන තීරයේ සඳහන් මයිසූර් කඩල, උඳු (පියළි නොකළ), කඩල පරිප්පු සහ අර්තාපල් පිළිබඳව එම උප ලේඛනයෙහි 2 සිට 5 දක්වා තීරයන්හි සඳහන් වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිලද, සිල්ලර වෙළෙන් දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිලද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි;

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වන උප තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද මෙහි පහත සඳහන් අනු පිළිවෙලින් 2 සිට 5 දක්වා ඇති තීරවල සඳහන් ප්‍රදේශයන්හි විකිණිය හැකි වැඩිම මිළ මෙදන් පටන් මේ උප ලේඛනයේ 2 සිට 5 දක්වා ඇති තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව 1958 ජුනි මස 25 වෙනි දින අංක 11,373 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසැට් පත්‍රයේ පලකරන ලද ආහාර ද්‍රව්‍ය සම්බන්ධව 1958 ජුනි මස 25 වෙනි දින වී. 47 වෙනි ආහාර මිළ නියෝගයේ (iii) සිට (viii) දක්වා ඡේදයන් මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැලකිය යුතුලෙස මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි මස 17 වෙනි දින දී සවස 3ට අත්සන් තබන ලදී.

ඇස්. සින්නතම්බි,
නියෝජ්‍ය (ආහාර) මිළපාලක තැන,
(වවුනියා දිස්ත්‍රික්කය)

### උප ලේඛනය

| 1වැනි තීරය | 2වැනි තීරය | | 3වැනි තීරය | | 4වැනි තීරය | | 5වැනි තීරය | |
|---|---|---|---|---|---|---|---|---|
| | වවුනියාව, පුදුකුලම, ආඩි කුලම, කලලිකුලම්, ඉරට් පෙරියකුලම්, මඩුකන්ද සහ නෙලුකුලම් | | නාවට්කුලම්,මරදමඩු,රායෙන් තුරකුලම්, සුදුවැන්දපිලවු, මාමඩුව, උපකුලම, වලයි වයිතුකුලම්, වෙඩ්ඩිකුලම්, කප්පට්ටිපලයවඩු, අනන්තර් පුලියන්කුලම්, මාන්කුලම්, ඕලුමඩු, මරුතෝඩායි, නෙඩුන්කර්නි, පලනියායි | | මුලතිව් සහ වෙල්ලමුලයිවයි කාල් | | කුඩුපුඩි මුරිප්පු, කච්චලායි මඩු අම්පුලපන්පොක්කායි, පුතුකුඩු ඉරිප්පු, කුමුල මුනයි, තන්නි යුත්තු මුල් ලිය වලලයි, කොක්කු තොඩුවායි, සහ කෝකිලායි | |
| | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1. උඳු (පියලි නොකල) ... | 48 0 ... | 0 45 ... | 49 50 ... | 0 46 ... | 50 50 ... | 0 47 ... | 52 0 ... | 0 48 |
| 2. කඩල පරිප්පු ... | 42 0 ... | 0 38 ... | 43 50 ... | 0 39 ... | 45 0 ... | 0 40 ... | 46 50 ... | 0 41 |
| 3. මයිසූර් පරිප්පු ... | 56 50 ... | 0 52 ... | 58 0 ... | 0 53 ... | 59 50 ... | 0 54 ... | 61 0 ... | 0 55 |
| 4. අර්තාපල් ... | 30 0 ... | 0 30 ... | 31 50 ... | 0 32 ... | 33 0 ... | 0 34 ... | 34 50 ... | 0 36 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ මිළ නොවේ. මෙවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.